ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 6 වන මට්ටම

අවසාන පරීක්ෂණය – 2005

අන්තර්ජාතික මානව හිමිකම් නීතිය – LWU 3325 / 4325

කාලය - පැය තුනයි

---

දිනය: 2006 අප්‍රේල් මස 18 වන දින වේලාව: ප. ව. 1.30 සිට ප.ව. 4.30 දක්වා

---

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.

1. පහත සඳහන් නීති විද්‍යා ගුරුකුල තුළ මානව අයිතිවාසිකම් පිළිබඳ සංකල්පය පිළිගෙන ඇති ආකාරය සම විෂම මත අයුරු සාකච්ඡා කරන්න.

   (අ) ස්වභාවික නීති විද්‍යා ගුරුකුලය
   (ආ) යථාදෘෂ්ටයිකවාදය
   (ඇ) මාක්ස්වාදය

2. මානව වර්ගයාගේ සමානාත්මතාවය පිළිබඳ සංකල්පය කෙතෙක් දුරට ලෝක ආගම් තුළ පිළිගෙන ඇත්දැයි සාකච්ඡා කරන්න.

   සමානාත්මතාවය පිළිබඳ නූතන මානව හිමිකම් මතවාදය ආගමික ඉගැන්වීම් සමග කෙලෙස සන්සන්දනය කළ හැකිද යන්න සම්බන්ධයෙන් විශ්ලේෂණයක් ඔබගේ සාකච්ඡාව තුළින් සැපයිය යුතුය.

3. හෙලෙනියාව ඉන්දියානු උපමහාද්වීපයේ පිහිටි කොදෙව් රාජ්‍යයකි. හෙලේනියාව බටහිර බලවතුන්ගේ පාලනයට යටත්ව ශත වර්ෂ පහක් පමණ පැවති අතර මෑතක දී ඇගේ නැතිවූ නිදහස ලබා ගත්තාය.

   මෑතක දී හෙලෙනියාවට සමාජ සුභසාධන සංවිධානයක් ලෙස පැමිණි විදේශකයින් කණ්ඩායමක් එහි ගම්වැසියන් හා ඔවුන්ගේ දරුවන්ට එක්තරා ආගමික විශ්වාසයක් පිළිබඳ අදහස් ප්‍රගුණ කිරීමට පටන් ගත්හ. ගම්වැසියන් පවසනුයේ මෙම ඉගැන්වීම් ශත වර්ෂ ගනනාවක් පැරණි සිය ආගමික දර්ශනයට, සදාචාරයට හා සාමාජීය සහජීවනයට පටහැනි බවයි. තවදුරටත් ඔවුන් කියා සිටිනුයේ මෙම ඉගැන්වීම් පිළිගැනීමට කැමති අයට මුදල් හා වෙනත් ද්‍රව්‍යමය දේ තෑගි දීමෙන් ඔවුන් වෙතට ආකර්ශනය කර ගනු ලබන බවත් ඔවුන්ට විරුද්ධ වන අය සමච්චලයට ලක් කර නොසලකා හරින බවයි.

   ගම්වැසියන්ගේ පැමිණිලි මත ක්‍රියාත්මක වූ හෙලේනියාවේ ආගමික නායකයින් කණ්ඩායමක් සදාචාර විරෝධී ලෙස ආගමට හරවාගැනීම් තහනම් කරමින් ආගමික අයිතීන් පිළිබඳ කෙටුම්පතක් සකස් කළහ. ඔවුහු මෙම කෙටුම්පත නීතියක් ලෙස පැණවීම සඳහා හෙලෙනියාවේ නීති සම්පාදකයින්ට ඉදිරිපත් කිරීමට අදහස් කරති. තමන් විසින් සකස් කරනු

ලැබූ එම කෙටුම්පත දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූල වන බව ඔවුහු කියා සිටිති.

දේශපාලන හා සිවිල් අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ තෙවන ඡේදය මෙසේ දක්වයි "....මහජන ආරක්ෂාව, යථා පැවැත්ම, සෞඛ්‍යය, සදාචාරය හෝ අන් අයගේ එවැනි මූලික නිදහස් හා අයිතින් ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන පරිදි යමෙකුට තමා කැමති ආගමක් හෝ විශ්වාසයක් ඇදහීමට අයිතිය සීමා කළ හැකිය".

හෙලේනියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ද මෙසේ සඳහන් වේ. "සෑම අයෙකුටම හෘද සාක්ෂියේ, චින්තනයේ හා ආගමික නිදහසට හිමිකම් ඇති අතර එයට යමෙකුගේ තෝරා ගැනීමට අනුව යම් ආගමක් හෝ විශ්වාසයක් දැරීමට හා ප්‍රගුණ කිරීමට ඇති අයිතිය ද ඇතුළත් වේ."

ආගමික අයිතින් පිළිබඳ හෙලේනියාවේ පාර්ලිමේන්තු උප කමිටුව මෙම කෙටුම්පත අන්තර්ජාතික සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ වගන්තිවලට අනුකූල වන්නේදැයි ඔබගේ නෛතික මතය විමසයි.

සාකච්ඡා කරන්න.

4. "ජාත්‍යන්තර අපරාධ නීතියේ ප්‍රධාන අපරාධ ජාත්‍යන්තර නීතියේ අනුලංඝනීය (jus cogens) කොටසක් හෙවත් ජාත්‍යන්තර නීතියේ මූලනියාමයන් ලෙස නිරන්තරයෙන්ම පිළිගනු ලබයි."

ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

5. "රාජ්‍ය පාර්ශවයන් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය සියලුම පියවර ගත යුතුය.

(අ) කාන්තාවන්ට හා පුරුෂයන්ට ආවේනික කාර්යභාරයන් හෝ කාන්තාව හා පුරුෂයා එකිනෙකාට පහත් හෝ උසස් යැයි යන අදහස් හෝ වෙනත් එවැනි චාරිත්‍රමය අගතීන් මුලනුපුටා දැමීමේ අදහසින් කාන්තාවන් හා පුරුෂයන්ගේ සාමාජීය හා සංස්කෘතිමය හැසිරීම් රටාව වෙනස් කිරීම සඳහා අවශ්‍ය හැම පියවරක්ම ගත යුතුය."

-කාන්තාවන්ට එරෙහිව සිදු කරන සියලුම ආකාරයේ වෙනස්කම්වලට එරෙහි ජාත්‍යන්තර ප්‍රඥප්තියේ 5 (අ) වගන්තිය.

ඔබගේ මතය අනුව ශ්‍රී ලංකාව ඉහත විධිවිධානය ප්‍රමාණාත්මකව පිළිගෙන ක්‍රියාත්මක කර තිබේ ද? ප්‍රබල නිදසුන් මගින් ඔබගේ පිළිතුර පහදන්න.

6. ළමා සොල්දාදුවන් පත් කිරීම සම්බන්ධයෙන් පවත්නා අන්තර්ජාතික ප්‍රඥප්තීන් හඳුනාගෙන එය සමකාලීන ශ්‍රී ලංකාවේ යථාර්තයන් ඇසුරින් විශ්ලේෂණය කරන්න.

7. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ මානව අයිතිවාසිකම් සුරැකීමේ ක්‍රමය හා එහි ඉතිහාසය විමසන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් මතෘකා 2 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) වධ හිංසාවට ලක් කිරීම සහ කෘෘර, අමානුෂික හා අවමන් සහගත සැලකිල්ලට එරෙහි විශ්ව සම්මුතිය

(ආ) කාන්තාවන්ට එරෙහිව සිදු කරන සියලුම ආකාරයේ වෙනස්කම්වලට එරෙහි ජගත් සම්මුතියට අනුබද්ධ වෛකල්පික සම්මුතිය (Optional Protocol)

(ඇ) Gillick එ. West Norfork and Wisbeck Area Health Authority (1986) A.C. 112

(ඈ) මානව අයිතිවාසිකම් සහ චාරිත්‍රානුකූල ජාත්‍යන්තර නීති නියාමයන්

හිමිකම් ඇවිරිණි

***********